**හෝමාගම ප්‍රාදේශීය සභාව - 2021**

-----------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

හෝමාගම ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට හෝමාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

-----------------------------------------------------------------------

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.670,548 ක් වටිනා දේපළ පිරියත හා උපකරණ පිරිවැය, වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා ඇති තොගය තුළ අන්තර්ගත කර තිබුණි. | මෙම වත්කම් 2022 වර්ෂය තුල නිකුත් කර ගබඩා තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කරමි. | දේපළ පිරියත හා උපකරණ ස්ථාවර වත්කම් යටතේ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ආ) | පෙර ගෙවීම් හා අත්තිකාරම්වල වැඩිවීම රු.3,331,160 ක් ද, සේවකයන්ගෙන් ලැබිය යුතු දෑ වැඩිවීම රු.1,844,233 ක් හා හුවමාරු ගනුදෙනුවලින් ලැබිය යුතු දෑ වල වැඩිවීම රු.30,582,510 ක් ද කාරක ප්‍රාග්ධන වෙනස්කම් යටතේ ගැලපිය යුතු ලැබිය යුතු දෑ වල අඩුවීම / වැඩිවීම යටතේ ගලපා නොතිබුණි. | සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය මේ සමඟ ඉදිරිපත් කරමි . | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ඇ) | ණයහිමි ලේඛණයේ ඇතුලත් ඇතැම් ණයහිමි ශේෂයන්, ණයහිමි ගිණුමට පිටපත් නොකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට වූ ණයහිමි ශේෂය රු.4,037,061 කින් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි. | 2022 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ණයහිමි ශේෂ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 වර්ෂයේදී පුර නැගුම ව්‍යාපෘතියෙන් ලද ගොඩනැගිලි පරිත්‍යාග වටිනාකම වන රු.78,014,305ක් සමාලෝචිත වර්ෂයේදී ලද ගොඩනැගිලි පරිත්‍යාග රු.70,014,305 ක් සේ සටහන් කිරීම හේතුවෙන් ගොඩනැගිලි හා ප්‍රාග්ධන ප්‍රදාන රු.8,000,000 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙය ගණන දෝෂයක් බැවින් 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. |
| (ඉ) | හඳුනා නොගත් ශේෂ ගිණුමේ පවතින රු.14,327,013 ක් වූ හර ශේෂයන් සහ රු.96,686,140 ක් වූ බැර ශේෂයන් සෑදී ඇති ආකාරය සමාලෝචිත වර්ෂය තුළදී ද හඳුනාගෙන නොතිබුණි. තවද ලැබිය යුතු ශේෂයන් සහ ගෙවිය යුතු ශේෂයන්හි වෙනස වන රු.82,365,928 ක් වූ ශේෂය විධිමත් අනුමැතියකින් තොරව හඳුනා නොගත් ශේෂ ගිණුමට හර කර සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | සංක්‍රාන්තිය සිදුවූ 2020.01.01 දිනට ලෙජර් ගිණුම් හා උපලේඛනවල ශේෂ අතර පැවති වෙනස හඳුනා නොගත් ශේෂ ගිණුම වෙත මාරු කිරීමට තටයුතු කර ඇත.ඒ අතරින් 2021 වර්ෂය තුලදී අනාවරණය කර ගත් වැරදි ජර්නල් සටහන් යොදා නිවැරදි කිරීමට කටයුතු කර ඇති අතර තවමත් පරීක්ෂා කරමින් පවතින ගිණුම්වල ශේෂ වලින් හඳුනා නොගත් ගිණුමේ ශේෂය සමන්විත වේ. | හඳුනා නොගත් ශේෂ හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කල යුතු වේ. |
| (ඊ) | 2020 වර්ෂයේදී මිලදී ගන්නා ලද ටිපර් රථය ප්‍රත්‍යාගණිත වත්කමක් ලෙසද ගිණුම්ගත කිරීම හේතුවෙන් වැඩියෙන් ඇතුළත් කළ වටිනාකම වූ රු.4,268,800 ක් ජර්නල් සටහන් අංක 3 මගින් රු.4,640,000 ක් ලෙස මෝටර් වාහන ගිණුමෙන් ඉවත් කිරීම හේතුවෙන් මෝටර් රථ ගිණුමේ වටිනාකම රු.371,200ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම තුලින් ජර්නල් සටහන් යොදා නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් වල නිවැරදි අගයන් ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන්ගේ එකතුව හා උපයෝගී පොත්/ උපලේඛණවලට අනුව ශේෂයන්ගේ එකතුව අතර රු.7,260,557ක වෙනසක් නිරීක්ෂණය විය. තවද සමාලෝචිත | 2022 වර්ෂයේ ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කල යුතු වේ. |

වර්ෂය සඳහා ඉදිරිපත්කර ඇති වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ ප්‍රධාන කාර්යාලයට අදාල ආපසු ගෙවිය යුතු පොදු තැන්පත් ශේෂය සඳහා ලබා දී ඇති උපලේඛණ අනුව ගණනය කිරීම් සහ වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ තැන්පත් ශේෂය අතර රු.1,675,934 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 පෙබරවාරි 29 දිනැති අංක 1/2016 දරන බස්නාහිර පළාත් පාලන චක්‍රලේඛයේ 2.2.2 ඡේදය | කැබ් රථයක් අළුත්වැඩියා කර ගැනීමට 2021 ජුලි 01 දින රු.494,500ක් ගෙවා තිබූ අතර ඒ සඳහා චක්‍රලේඛය ප්‍රකාරව තාක්ෂණික හෝ යාන්ත්‍රික ඉංජිනේරු උපදෙස් ලබා ගෙන නොතිබුණි. | සභාවේ වාහන අළුත්වැඩියාවන් සම්බන්ධව නිර්දේශ ලබා ගැනීමට කාර්මික නිලධාරියෙකු (වාහන) හෝ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු නොමැති අතර බාහිර ආයතන නිලධාරියෙකුගේ සහයෝගය ලබා ගන්නේනම් ඒ සඳහා අමතර මුදලක් ගෙවීමට සිදුවන අතර වැඩි කාලයක්ද ගතවේ. ප්‍රායෝගිකව මෙම කටයුතු සිදුකිරිම අපහසු බැවින් සේවා අවශ්‍යතාවය මත කඩිනමින් වාහනය අළුත්වැඩියාකර ලබාදිය යුතුවේ. | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කලයුතු වේ. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 128 වගන්තිය | සභාව විසින් භුක්ති විඳින ගොඩනැගිලි සහ ක්‍රීඩාපිටි, ඔසු උයන් ආදිය ඇතුළත් ඉඩම් 17 ක් හා සුසාන භූමි 31 ක් සභාව වෙත අත්පත් කරගෙන නොතිබුණි. | ඉඩම්වල අයිතිය නිවැරදිව තහවුරු කර ගැනීමෙන් පසුව එම ඉඩම් පවරා ගැනීමට කටයුතු කරන අතර ඉඩම්වල සැලැස්මට අනුව මායිම් ලකුණුකර නිරවුල් කිරීමට මිනින්දෝරු මහතාට යොමුකර ඇත. | ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් නොපමාව කටයුතු කල යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ V වන පරිච්ඡේදයේ 296 වන ඡේදය | සෑම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයකම කර්මාන්ත බද්ද හා වෙළඳ ව්‍යාපාර බද්දට යටත් දේපළ පිළිබඳ සමීක්ෂණයක් සිදු කළ යුතු වුවත් ගැසට් පත්‍රය ප්‍රකාරව 2022 මාර්තු 14 දින වනවිටත් සමීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | දේපළ සමීක්ෂණ ගැසට් පත්‍රය ප්‍රකාරව සිදු කල යුතු වේ. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------------------ | | | |
| (i) | මුදල් රෙගුලාසි 177(1) | සභාවේ ආදායම් කොටසක් වශයෙන් හෝ නොඑසේම හෝ තම තමන්ට ලැබුණු මුළු මුදල දිනපතාම හෝ හැකිතාක් කලින් හෝ නිසි ප්‍රතිග්‍රාහක නිලධාරියාට හෝ ගණන් දීමේ නිලධාරියා විසින් එසේ විධාන කර තිබෙන ආකාරයකට නොපමාව ආයතනයට ගෙවීම් කළ යුතු වුවද, එම ගෙවීම් සතියකට වඩා ප්‍රමාද කල අවස්ථා නිරීක්ෂණය විය. | එකතු කරනු ලබන මුදල් කඩිනමින් සභාවට අයකර ගැනීම සඳහා ගිවිසුමේ කොන්දේසි සංශෝධනය කිරීමට තීරණය කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව එකතු කරනු ලබන මුදල් කඩිනමින් සභාවට ලබා ගැනීමට කටයුතු කල යුතු වේ. |
| (ii) | මුදල් රෙගුලාසි 880 | රජයේ මුදල්, ආදායම්, බඩු බාහිරාදිය භාරව සිටින නිලධාරීන් ස්වකීය රාජකාරිය අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුව ඇප තැන්පත් කළ යුතු වුවත් සභාවේ ඇප තැබිය යුතු නිලධාරීන් පස්දෙනෙකු ඇප තබා නොතිබුණි. | ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් පස් දෙනෙකුගෙන් ඇප මුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කල යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2015 ජූලි මස 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | තත්කාර්යය අතුරු අග්‍රිමය ලබාදෙන කාර්යයට ආසන්නම දිනයක දී අග්‍රිමය ලබා ගත යුතු බවත් එම කාර්යය නිම කර දින 10 ක් ඇතුළත අග්‍රිමය පියවිය යුතු වුවත් දින 4 සිට 60 දක්වා කාලයක් ප්‍රමාද වී අත්තිකාරම් පියවූ අවස්ථා 30 ක් සමාලෝචිත වර්ෂයේදී නිරීක්ෂණය විය. | අත්තිකාරම් පියවීම් ප්‍රමාද වීම නැවත ඇති වීම වළක්වා ගැනීමට පියවර ගන්නා බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව අග්‍රිම අප්‍රමාදීව පියවීමට කටයුතු කල යුතු වේ. |
| (ඊ) | 2021 සැප්තැම්බර් 29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021 හි 2.4 වගන්තිය | ප්‍රජා පාදක සංවිධානයකට කොන්ත්‍රාත්තුවක් පිරිනමන අවස්ථාවේදී අදාළ ප්‍රජා පාදක සංවිධානය කොන්ත්‍රාත් තුනකට වඩා වැඩි කොන්ත්‍රාත් ප්‍රමාණයක නිරත වී නොසිටිය යුතු වුවත් එම චක්‍රලේඛයට පටහැනිව ප්‍රජා පාදක සංවිධාන 05 කට, කොන්ත්‍රාත් 03 කට වැඩියෙන් පිරිනමා තිබූ අවස්ථා නිරීක්ෂණය විය. | ප්‍රදේශයට අදාල වෙනත් සමිති ලියාපදිංචි වී නොතිබුණ හෙයිනුත් වර්ෂය තුලම ව්‍යාපෘති අවසන් කල යුතුව තිබූ හෙයිනුත් එක් සමිතියකට ලබා දිය හැකිව ඇති මුදල ඉක්මවා නොයන බැවින් හා ප්‍රමාණවත් කාලයක් නොතිබූ හෙයින් අදාල සමිති වලින් ක්‍රියාත්මක කරන ලදි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

2. **මූල්‍ය සමාලෝචනය**

-------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ අයභාරය රු.215,580,460 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.216,747,584 ක් විය. මූල්‍ය ප්‍රතිඵලය පූර්ව වර්ෂයට සාපේක්ෂව රු.1,167,124 කින් පිරිහී තිබුණු බව නිරීක්ෂණය විය.

2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

---------------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උසාවි දඩ | | |
| | හෝමාගම සහ කැස්බෑව මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ශේෂය රු.92,239,111 ක් විය. | 2017,2018 වර්ෂයන්ට අදාල සියලු දඩ මුදල් ලැබී අවසන් අතර 2019 වර්ෂයට අදාල උපලේඛන සකස්කර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. 2020 හා 2021 වර්ෂයන්ට අදාළව මහේස්ත්‍රාත් අධිකරණවල උසාවි දඩ උප ලේඛන පිළියෙල කිරීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවති. | අයවිය යුතු උසාවි දඩ ආදායම් අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතු වේ. |
| (ආ) | බිම් කුලි | | |
| | මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය සඳහා බදු දී ඇති අක්කර 1 රූඩ් 2 පර්චස් 10.31 ක් විශාලත්වයක් ඇති සභාව සතු ඉඩම 2003 පෙබරවාරි 07 දින සිට අවුරුදු 33 ක දීර්ඝ කාලයකට එම ආර්ථික මධ්‍යස්ථානයට බදු දී තිබුණි එහෙත් ඒ වෙනුවෙන් 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය අවසානය දක්වා සභාවට ලැබිය යුතු හිඟ හිටි බිම් කුලිය සහ දඩ මුදල ලෙස රු.198,450,000 ක් 2021 දෙසැම්බර් 31 දිනටද අයවිය යුතුව පැවතුණි. බදු ගැණුම්කරු විසින් ගිවිසුම් ප්‍රකාරව බදුකුලි නොගෙවන්නේ නම් ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව බදු ගිවිසුමෙහි ඇතුලත් කර නොතිබීම හේතුවෙන් මෙම හිඟ කුලී අය කර ගැනීමට හෝ බදු කුලී ගිවිසුම අවලංගු කිරීමට නොහැකි වී තිබෙන බවද නිරීක්ෂණය විය. | මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ කුලී මුදල් නොගෙවූ අවස්ථාවන්හිදී ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් බදු ගිවිසුමේ ඇතුළත් කර නොතිබීම හේතුවෙන් ඒ සම්බන්ධව සභාවේ නීතිඥතුමියගෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකර හිඟ හිටි ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මුද්දර ගාස්තු<br>---------------<br>2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.378,443,654 ක් විය. | හෝමාගම ප්‍රාදේශීය සභාව සඳහා කොළඹ, දෙල්කඳ, ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ 2019 වර්ෂයේ සිට හා හෝමාගම ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ 2020 වර්ෂයේ සිට ඔප්පු මුද්දර ගාස්තු උපලේඛන සැකසීමට ඇත.තොරතුරු ලද විගස අදාල ලේඛන යාවත්කාලීන කිරීම සිදුවන බව සඳහන් කරමි. | මුද්දර ගාස්තු අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**
-----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**
------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය සඳහා පානීය ජලය ලබා ගැනීමේදී මාර්ගයට සිදුවන හානිය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු වන රු.9,863,471 ක් සමලෝචිත වර්ෂයේදී නිදහස් කර තිබුණි. ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම මත තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඉල්ලුම්කරුවන් විසින් මාර්ගය නැවත සෑදීමට යටත්ව ප්‍රාදේශීය සභාව විසින් මුදල් නිදහස් කර ඇති නමුත්, ඒ පිළිබඳව තාක්ෂණ නිලධාරීන් විසින් පසු විපරමක් සිදු කර නොතිබුණු අතර නිදහස් කර ඇති මාර්ගවලින් දැනට සකස් කර ඇති පාරවල් මොනවාද යන්න හඳුනාගැනීමක් සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පසු විපරමක් සිදු කර නිදහස් කර ඇති මාර්ගවලින් දැනට සකස් කර ඇති පාරවල් මොනවාද යන්න හඳුනාගැනීමක් කළ යුතු වේ. |
| (ආ)<br>(i) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය<br>---------------------------------<br>ප්‍රාදේශීය සභා පනතේ 93 වන වගන්තිය ප්‍රකාරව කසළ කළමනාකරණය සම්බන්ධයෙන් වාර්ෂික සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ හා JJCA ආයතනයේද සහයෝගයෙන් 2022 වර්ෂයේ පස් අවුරුදු සැලැස්මක් සකස් කිරීමට පියවර ගත හැකිය. | කසළ කළමනාකරණය සම්බන්ධයෙන් වාර්ෂික සැලැස්මක් පිළියෙල කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | දිරාපත්වන කසළ වෙනත් අංගනයක් වෙත ප්‍රවාහනය නොකර කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලියකට භාජනය කර ඵලදායී ලෙස උපයෝජනය කිරීමක් හෝ පොහොර විකිණීමෙන් සභාවට ආදායමක් ලබා ගැනීමේ ක්‍රමවේදයකට 2022 මාර්තු මස අවසාන දින වන විටත් අවතීර්ණ වී නොතිබුණි. | කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ඉල්ලා ඇත. | කඩිනමින් කාබනික පොහොර නිපදවීම හා ආදායම් ඉපැයීම් මාර්ග වලට අවතීර්ණ විය යුතු වේ. |
| (iii) | නගර මධ්‍යයේ ඇති කසළ අංගනය සඳහා කසළ එකතු කිරීම මගින් නගර අශෝභනය, දුර්ගන්දය හා අපවිත්‍රවීම පිළිබඳව අවධානය යොමු වී නොතිබුණි. | මෙම ස්ථානය සඳහා ලැබෙන අපද්‍රව්‍ය අවම කිරීම සඳහා කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීමට සහ සම්පත් මධ්‍යස්ථානයක් ඉදි කිරීමට යෝජනා කර ඇත. | කසළ රැස් කරන ස්ථානය පිළිබඳ අවධානය යොමු කල යුතු වේ. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කිරිවත්තුඩුව කහටගහවත්තලන්ද, පුබුදු උයන පොදු ඉඩම්**<br>1996 ජනවාරි 23 දිනැති ඔප්පු අංක 497 මගින් ද පිනැන්ස් සමාගම විසින් සභාවට ලබා දී ඇති ලොට් අංක 106 යටතේ රූඩ් 1 පර්චස් 7.52 ක පොදු පහසුකම් ඉඩමෙන් පර්චස් 14.66 ක පමණ බිම් ප්‍රමාණයක් එම ඉඩම අවට පදිංචිකරුවකු විසින් කොන්ක්‍රීට් වහළ සහිත ගෙයක්ද, තාවකාලික ලෙස සකස්කළ කඩයක්ද තනා තිබූ බව අනාවරණය විය. තවද එම නිවාස සඳහා ජලය, හා විදුලියද ලබා ගෙන තිබූ අතර, වරිපනම්ද ඉල්ලුම් කර ඇති බව නිරීක්ෂණය විය. නමුත් මෙම ඉඩම සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුද සභාව සතු කරගෙන නොතිබුණි. | කිරිවත්තුඩුව කහටගහ වත්තලන්ද, පුබුදු උයන පොදු ඉඩමේ අනවසර ඉදිකිරීමක් පවතින බැවින් එහි සන්තකය පවරා ගැනීමට අදාළ ලියකියවිලි පලාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කිරීමෙන් පසු ඉදිරි කටයුතු සඳහා නීති නිලධාරි වෙත යොමු කර ඇත. නීති නිලධාරි විසින් මිනින්දෝරු සැලැස්මේ පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කිරීමට සභාවේ මිනින්දෝරු මහතාට යොමු කර ඇත. | ඉඩම් වල අයිතිය කඩිනමින් තහවුරු කර ගැනීමට කටයුතු කල යුතු වේ. |

(ආ) ජල්තර රණාල ලක්සිරි උද්‍යානයේ පොදු ඉඩම
------------------------------------------------------

| | | |
|---|---|---|
| ජල්තර රණාල ලක්සිරි උද්‍යානයේ පිහිටි අක්කර 1 පර්චස් 19.50 ක ක්‍රීඩා පිටියට යාබද පොදු පහසුකම් ඉඩම පෞද්ගලික පාර්ශවයක් විසින් අත්පත් කරගෙන වගා කටයුතු සිදුකර තිබුණද. මෙම ඉඩම් වෙන්කර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විටත් සභාව කටයුතු කර නොතිබුණි. | තාක්ෂණ නිලධාරී ස්ථානීය පරීක්ෂණයෙන් පසුව එම ඉඩම අදාල බිම් සැලැස්මට අනුව මායිම් ලකුණු කර නිරවුල් කිරීමට මිනින්දෝරු මහතාට යොමු කර ඇත. නිවැරදි මායිම් ලකුණු කිරීමෙන් පසු ආරක්ෂිත වැටවල් සකස් කරනු ලැබේ. | ඉඩම කඩිනමින් සභාවට පවරා ගැනීමට කටයුතු කල යුතු වේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | සභාවේ අදහස් දැක්වීම<br>------------------------ | නිර්දේශය<br>----------- |
|---|---|---|
| සේවක ණය<br>-------------- | | |
| මිය ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා ස්ථාන මාරුවීම් ලද 47 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,600,949 ක් වූ දේපළ, ආපදා, විශේෂ පාපැදි හා උත්සව ණය මුදල් අයකර ගැනීමට පියවරගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | සේවක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. |

# 4 ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය
-----------------------------------------------

## 4.1 තිරසාර සංවර්ධන අරමුණු
------------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | සභාවේ අදහස් දැක්වීම<br>------------------------ | නිර්දේශය<br>----------- |
|---|---|---|
| සභාව විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 'තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය' 2030 ප්‍රකාරව ලඟා කරගත යුතු අරමුණු 17ක් පැවතියද හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් අරමුණු 9 ක් පිළිබඳව සැලසුම් සකස් කර තිබුණි. එම අරමුණු යටතේ 2021 වර්ෂයේ ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දර්ශක හඳුනාගෙන තිබුණද සැලසුම් කළ කාර්යයන් / ක්‍රියාකාරකම් 06ක් ඉටුකර නොතිබුණි. | 2021 වසර සඳහා සැලසුම් කරන විට එම වසර තුලදී කොරෝනා වසංගත තත්වය පහව යනු ඇතැයි අනුමාන කර සැලසුම් සකස් කළද එම වසර තුලදීද එම වසංගත තත්වය පැවතීම හේතුවෙන් සැලසුම් සකස් නොකල කටයුතු සඳහා වැඩි වියදමක් දැරීමට සිදුවිය. | විවිධ ක්‍රියාකාරකම් ඉටුකිරීමට කටයුතු කල යුතු වේ. |